# ගෙවුම් තුලනය


## සමස්ත උපනතීන්

ආර්ථිකය තුළ නොකඩවා පැවති අධි ඉල්ලුම් පීඩනය, විදේශ වෙළෙඳ අනුපාතිකයෙහි පිරිහීම සහ විදේශ ප්‍රාග්ධන ගලාඒම් අඩුවීම හේතුවෙන් 1994 වර්ෂයේදී ගෙවුම් තුලනයෙහි සමස්ත අතිරික්තය තියුණු ලෙස පිරිහීමකට ලක් විණි. අධික සමස්ත ඉල්ලුම තුළින් පැන නැඟුණු ආනයන වියදම වැඩිවීම සහ වෙළෙඳ අනුපාතිකය සියයට 4.7 කින් පිරිහීම, වෙළෙඳ හිඟය 1993 වර්ෂයේ විගැහි දශලක්ෂ 825 ( රුපියල් දශලක්ෂ 55,486 හෙවත් ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 11.1) සිට 1994 වර්ෂයේ විගැහි දශලක්ෂ 1,095 (රුපියල් දශලක්ෂ 77,644 හෙවත් ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13.4) දක්වා පුළුල් වීමට හේතුවිය. සේවා ගිණුමෙහි ලැබීම් සම්බන්ධයෙන් යම් ප්‍රමාණයක යහපත් වර්ධනයක් පෙන්නුම් කළත්, සංචාරක කටයුතු සඳහා විදේශ විනිමය විශාල ලෙස පිටතට ගලා යාමත් ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර වෙළෙඳපළෙහි පොලී අනුපාතිකයන් අතර පැවති වෙනස අඩුවීම සහ වර්ෂය තුළ පැවති දේශපාලන අවිනිශ්චිතභාවය හා බැඳුනු සාර්ව ආර්ථික කටයුතුවල ඇති වූ අයහපත් තත්ත්වය නිසා ලාභ හා ලාභාංශ වශයෙන් විදේශ විනිමය පිටතට ගලායාම වැඩිවීමත් නිසා 1993 දී සේවා ගිණුමෙහි විගැහි දශලක්ෂ 28 ක් වූ අතිරික්තය 1994 දී විගැහි දශලක්ෂ 12 දක්වා අඩුවිය. 1993 දී සියයට 17 ක වර්ධනය හා සැසඳීමේදී, 1994 දී සියයට 10 ක වර්ධනයක් වාර්තා කළ පෞද්ගලික සංක්‍රාම ලැබීම් මැද පෙරදිග සේවයේ නියුතු විදේශගත ශ්‍රී ලාංකිකයන් විසින් ප්‍රේෂණය කරන ලද සංක්‍රාමවල අඛණ්ඩ වැඩිවීම තවදුරටත් පිළිබිඹු කරමින් රටෙහි විදේශීය වත්කම්වලට ඉහළ දායකත්වයක් ලබාදුණි. කෙසේ වුවද, විශේෂයෙන්ම, ඉහළ වෙළෙඳ අසමතුලිතාවය තුලින් ඇති වූ බලපෑම නිසා ජංගම ගිණුමෙහි හිඟය ( නිල සංක්‍රාම සඳහා ගැලපීම් කිරීමට පෙර) 1993 දී විගැහි දශලක්ෂ 250 සිට 1994 දී විගැහි දශලක්ෂ 646 දක්වා පුළුල් වූ අතර එය ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයයට 5.3 සිට සියයට 7.9 දක්වා වර්ධනයක් පෙන්විය. විගැහි දශලක්ෂ 115 ( රුපියල් දශලක්ෂ 8,069) ක්වූ නිල සංක්‍රාම සඳහා ගැලපීම් කළ පසු ජංගම ගිණුමේ හිඟය ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 1993 දී සියයට 3.8 සිට 1994 දී සියයට 6.5 දක්වා වැඩි විය.

1994 වර්ෂයේදී ප්‍රාග්ධන ගිණුමෙහි ලැබීම්වල වර්ධනය කැපී පෙනෙන ලෙසින් මධ්‍යස්ථ විය. අවිනිශ්චිත සාර්ව ආර්ථික වාතාවරණය, ජාතික මැතිවරණ මධ්‍යයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම් කැපී පෙනෙන ලෙසින් ලිහිල්වීම සහ ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපල පොලී අනුපාතිකයන් අතර වෙනස අඩුවීම යන හේතූන් නිසා කොටස් වෙළෙඳපොල ආයෝජනයන්හි තියුණු අඩුවීමක් හා සෘජු විදේශීය ආයෝජන ගලාඒම්වල මධ්‍යස්ථ වීමක් දක්නට ලැබුණි. මෙම ගිණුම් දෙකෙහි ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 182 සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 131 දක්වා අඩුවිය. විදේශීය ආධාරවල නොකඩවා පැවති ඌණ උපයෝජනය තවදුරටත් පෙන්නුම් කරමින්, රජයට ලැබුණු ප්‍රාග්ධන ගලාඒම් 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 334 සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 283 දක්වා අඩු විය. මේ අතර, රටෙහි විදේශීය ණය ප්‍රමාණය වැඩි කරමින් දිගු හා කෙටිකාලීන ශුද්ධ පෞද්ගලික ණය ප්‍රාග්ධන ගලාඒම් 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 240 සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 398 දක්වා සැළකියුතු ලෙස වැඩිවිය. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන්ම, එයාර් ලංකා අභ්‍යන්තර ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ කළ මූල්‍යනය කිරීම්, කෙටිකාලීන පෞද්ගලික වෙළෙඳ ණය හා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් විසින් විදේශීය ව්‍යවහාර බැංකු මුදල් ඒකක වලින් ගත් ණයවල ප්‍රතිඵලයකි. ප්‍රාග්ධන ගිණුමේ ගණුදෙනුවල සමස්ත ප්‍රතිඵලයක් ලෙස, ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධනය දෙවසර තුළදී විගැහි දශලක්ෂ 612 (රුපියල් දශලක්ෂ 41,066) සිට විගැහි දශලක්ෂ 674 (රුපියල් දශලක්ෂ 48,058) දක්වා මද වශයෙන් වැඩිවිය. ඒ අනුව 1993 වර්ෂයේ පැවති විගැහි දශලක්ෂ 375 (රුපියල් දශලක්ෂ 24,149) හා සැසඳීමේදී, 1994 වර්ෂයේදී ගෙවුම් තුලනය විගැහි දශලක්ෂ 173 ( රුපියල් දශලක්ෂ 17,166) ක සමස්ත අතිරික්තයක් වාර්තා කළේය. මේවායේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් 1993 වර්ෂාවසානයේදී විගැහි දශලක්ෂ 1,544 (රුපියල් දශලක්ෂ 105,258) සිට 1994 වර්ෂාවසානයේදී විගැහි 1,792 (රුපියල් දශලක්ෂ 130,340) දක්වා වැඩි විය.

# ගෙවුම් තුලනය

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1.52 සංඛ්‍යා සටහන

## 1990 - 1994 ගෙවුම් තුලනය - විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ | -518 | -726 | -740 | -825 | -1,095 | -28,145 | -41,252 | -45,785 | -55,486 | -77,644 |
| අපනයන | 1,456 | 1,491 | 1,745 | 2,046 | 2,236 | 79,481 | 84,379 | 107,855 | 138,174 | 158,554 |
| ආනයනය | 1,974 | 2,217 | 2,485 | 2,871 | 3,331 | 107,626 | 125,631 | 153,640 | 193,660 | 236,198 |
| 2. සේවා | -72 | -65 | -23 | 28 | 12 | -3,905 | -3,773 | -1,430 | 1,821 | 820 |
| ලැබීම් | 391 | 440 | 489 | 535 | 627 | 21,365 | 24,897 | 30,256 | 36,050 | 44,363 |
| ගෙවීම් | 463 | 505 | 513 | 507 | 615 | 25,269 | 28,670 | 31,686 | 34,229 | 43,543 |
| 3. භාණ්ඩ හා සේවා (1+2) | -590 | -791 | -763 | -797 | -1,083 | -32,050 | -45,025 | -47,215 | -53,665 | -76,824 |
| 4. සංක්‍රාම (ශුද්ධ) | 398 | 441 | 457 | 517 | 552 | 21,660 | 25,030 | 28,280 | 34,839 | 39,057 |
| පෞද්ගලික (ශුද්ධ) | 268 | 293 | 328 | 402 | 438 | 14,518 | 16,623 | 20,253 | 27,090 | 30,989 |
| නිල (ශුද්ධ) | 130 | 148 | 130 | 115 | 115 | 7,142 | 8,407 | 8,027 | 7,749 | 8,069 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) | -192 | -350 | -306 | -281 | -531 | -10,390 | -19,995 | -18,935 | -18,825 | -37,767 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය (ශුද්ධ) | 345 | 475 | 381 | 612 | 674 | 18,931 | 27,171 | 23,450 | 41,066 | 48,058 |
| සෘජු ආයෝජන (ශුද්ධ) | 24 | 46 | 86 | 134 | 111 | 1,294 | 2,633 | 5,315 | 9,107 | 7,815 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | 7 | 24 | 18 | 48 | 20 | 390 | 1,329 | 1,122 | 3,272 | 1,334 |
| පෞද්ගලික දිගුකාලීන (ශුද්ධ) | -33 | -18 | 18 | 135(ඇ) | 216(ඇ) | -1,835 | -1,005 | 1,162 | 8,998(ඇ) | 15,628(ඇ) |
| පෞද්ගලික කෙටිකාලීන | 48 | 35 | 91 | 105 | 182 | 2,685 | 2,105 | 5,652 | 7,110 | 12,933 |
| රාජ්‍ය දිගුකාලීන (ශුද්ධ) | 299 | 366 | 189 | 190 | 146 | 16,397 | 20,849 | 11,494 | 12,579 | 10,348 |
| ලැබීම් | 392 | 463 | 313 | 334 | 283 | 21,497 | 26,378 | 19,193 | 22,317 | 20,050 |
| ගෙවීම් | 93 | 97 | 124 | 144 | 137 | 5,100 | 5,529 | 7,699 | 9,738 | 9,702 |
| රාජ්‍ය කෙටිකාලීන | - | 23 | -22 | - | - | - | 1,260 | -1,295 | - | - |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි | - | - | - | - | - | 751 | 235 | 1,555 | -1,420 | -1,380 |
| 8. විගැහි වෙන්කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| 9. වැරදීම් හා අත්හැරීම් | -14 | +28 | +59 | +44 | + 29 | -1,812 | +2,729 | +3,399 | +3,328 | +8,255 |
| 10. සමස්ත ශේෂය | +138 | +152 | +133 | +375 | +173 | +7,480 | +10,140 | +9,469 | +24,149 | +17,166 |
| 11. මූල්‍ය වෙනස්වීම් (-අතිරික්තය) | -138 | -152 | -133 | -375 | -173 | -7,480 | -10,140 | -9,469 | -24,149 | -17,166 |
| විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල්/විගැහි | | | | | | 54.42 | 56.61 | 61.75 | 67.39 | 70.75 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| වෙළෙඳ ගිණුම | | | | | | -8.75 | -11.07 | -10.82 | -11.10 | -13.41 |
| ජංගම ගිණුම | | | | | | -3.23 | -5.37 | -4.47 | -3.77 | -6.53 |
| ජංගම ගිණුම-ප්‍රදානයන් ඉවත්කළ පසු | | | | | | -5.45 | -7.62 | -6.37 | -5.32 | -7.92 |

(අ) සංශෝධිත. (ආ) තාවකාලික.

(ඇ) ගුවන් යානා හතරක් ආනයනය කිරීම සඳහා පසුගිය වර්ෂවලදී ගෙවන ලද අත්තිකාරම් ගෙවීම් වල ගැලපුම් ප්‍රාග්ධන ලැබීම්වලට ඇතුළත්වේ.

සටහන : මූල්‍ය අංශයේ සියළු ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ පැවති විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, 1994 මාර්තු මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (ජ.මූ.අ.) ගිවිසුම් වගන්ති VIII වැනි වගන්ති යටතේ ඇති බැඳීම් ශ්‍රී ලංකාව විසින් පිළිගැනීමත් සමඟ, ජංගම ගිණුමේ ගණුදෙනු මත පැවති සියළුම සීමාවන් ඉවත් කළ අතර, එවැනි ගණුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියල නිදහසේ හුවමාරු කිරීමට ඉඩදෙන ලදී. මෙය, රටේ ක්‍රියාත්මක වෙමින් පවතින නිදහස්කරණ වැඩපිළිවෙල යටතේ ඉදිරියට තැබූ ප්‍රධාන පියවරකි. ලංකාවේ විදේශීය වත්කම් මාස 6 ක පමණ ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත් මට්ටමකට ලඟා වූවද, ගෙවුම් තුලනය මත අඛණ්ඩව පැවති ඉහළ ඉල්ලුම් පීඩනයේ අහිතකර බලපෑමත්, විවෘත ආර්ථික පරිසරයක් තුළ ලංකා ආර්ථිකයේ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා මනාව සැකසූ මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්ති තුලින් සාර්ව ආර්ථික පරිසරයේ ස්ථාවරත්වයක් ලබා ගැනීමේ අවශ්‍යතාවත්, 1994 ගෙවුම් තුලනයෙහි සමස්ත වර්ධනයන් තුළින් පෙන්නුම් කෙරුණි.

## ගෙවුම් තුලන විග්‍රහය

### වෙළෙඳ ගිණුම

1994 වර්ෂයේදී ආනයන හා අපනයනයන්හි ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳ ගිණුමෙහි සැළකිය යුතු පිරිහීමක් ඇති විය. 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 2,046 (රුපියල් දශලක්ෂ 138,174) සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 2,236 (රුපියල් දශලක්ෂ 158,554) දක්වා අපනයන ඉපැයීම් වැඩි වූ අතර, එයින් අපනයන අංශයෙහි සියයට 9 ක මධ්‍යස්ථ වර්ධනයක් පිළිබිඹු විය. 1993 දී අපනයන අංශය සියයට 17 කින් වර්ධනය විය. කෘෂිකාර්මික, කාර්මික සහ අනිකුත් සුළු අපනයන යන සියළුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්හි අඩු වර්ධන වේගයන් දක්නට ලැබුණ අතර, එයට බෙහෙවින්ම හේතු වූයේ තේ සහ ඇඟළුම් අපනයනයන් ඇතුළු අපනයන භාණ්ඩවල මිළ ගණන් පහත් මට්ටමක පැවතීමයි. මේ අතර, ආයෝජන හා පරිභෝජන භාණ්ඩ, විශේෂයෙන්ම සීනි සහ කල්පවත්නා පාරිභෝජන භාණ්ඩ සඳහා පැවති ඉහළ ඉල්ලුම නිසා ආනයන වියදම 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 2,871 (රුපියල් දශලක්ෂ 193,660) සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 3,331 (රුපියල් දශලක්ෂ 236,198) දක්වා සියයට 16 කින් වැඩි විය. ආර්ථික වෘද්ධිය සඳහා උපකාරි වන යන්ත්‍ර සූත්‍ර උපකරණ හා අනිකුත් ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වූ ආනයන වියදම් වැඩිවීමට අමතරව එයාර් ලංකා අභ්‍යාවකාශ ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ ගෙන්වන ලද එ. ජ. ඩොලර් දශලක්ෂ 228 ක් වටිනා ගුවන් යානා දෙක සඳහා වූ වියදමද ආයෝජන භාණ්ඩ වියදම වැඩිවීම තුළින් පිළිබිඹු විය. මේ අනුව, වෙළෙඳ හිඟය 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 825 (රුපියල් දශලක්ෂ 55,486) සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 1,095 (රුපියල් දශලක්ෂ 77,644) දක්වා පුළුල් විය. ද. දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළෙඳ හිඟය 1993 වර්ෂයේදී සියයට 11.1 සිට 1994 වර්ෂයේදී සියයට 13.4 දක්වා වැඩිවිය. විශේෂිත ආනයන ලෙස සැළකෙන ගුවන් යානාවල වටිනාකම් ඉවත් කළ පසුද 1994 වසරේ වෙළෙඳ හිඟය ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 1993 දී සියයට 10.3 සිට 1994 දී සියයට 11.5 දක්වා ඉහළ ගියේය.

### සේවා ගිණුම

සේවා ගිණුමෙහි ලැබීම් 1993 දී විගැහි දශලක්ෂ 535 සිට 1994 දී විගැහි දශලක්ෂ 627 දක්වා වැඩි වූ අතර, ගෙවීම් විගැහි දශලක්ෂ 507 සිට විගැහි දශලක්ෂ 615 දක්වා වැඩි විය. ඒ අනුව, සේවා ගිණුමෙහි අතිරික්තය 1993 විගැහි දශලක්ෂ 28 ( රුපියල් දශලක්ෂ 1,821) සිට 1994 විගැහි දශලක්ෂ 12 (රුපියල් දශලක්ෂ 820) දක්වා අඩුවිය. සේවා ලැබීම් අංශයෙහි විශේෂයෙන්ම වරාය, ප්‍රවාහන හා රක්ෂණ, සංචාරක හා අනිකුත් සේවාවන් ඇතුළත් සියළුම ප්‍රධාන අංශයන්හි වැඩි දියුණු වූ ක්‍රියාකාරිත්වයක් වාර්තා විය. 1994 වර්ෂයේදී සංචාරකයින් පැමිණීමේ ප්‍රමාණය 1982 පැවති වාර්තාගත මට්ටම ඉක්මවූ අතර, සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමෙහි වැඩිවීමක් සිදු විය. ඒ අනුව 1993 වර්ෂයේදී වාර්තා වූ සියයට 5 ක සංචාරක ඉපයීම්වල වර්ධනය හා සැසඳීමේදී 1994 වර්ෂයේදී සංචාරක ඉපැයීම් විගැහි දශලක්ෂ 161 දක්වා සියයට 10 කින් වැඩි විය. කෙසේ වුවද, ශ්‍රී ලාංකිකයින්ගේ විදේශීය සංචාරය කිරීම්වල වැඩිවීම පිළිබිඹු කරමින් සංචාරක ගෙවීම් වලද සැළකිය යුතු වැඩිවීමක් වාර්තා විය.

ආයෝජන ආදායම් ගලාඒම් 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 100 දක්වා සියයට 27 කින් වැඩි විය. මෙයට බෙහෙවින්ම හේතු වූයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය වත්කම් 1993 දී

## 1.53 සංඛ්‍යා සටහන
## 1990 - 1994 සේවා සහ සංක්‍රාම

| ශීර්ෂය | විදේශ දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) |
| 1. වරාය, ප්‍රවාහන හා රක්ෂණය | 10 | 28 | 32 | 73 | 96 | 522 | 1,588 | 1,965 | 4,944 | 6,825 |
| ලැබීම් | 125 | 150 | 157 | 171 | 207 | 6,816 | 8,497 | 9,696 | 11,509 | 14,626 |
| ගෙවීම් | 115 | 122 | 125 | 98 | 111 | 6,293 | 6,909 | 7,731 | 6,565 | 7,701 |
| 2. සංචාර | 40 | 45 | 60 | 60 | 43 | 2,190 | 2,545 | 3,711 | 3,985 | 2,995 |
| ලැබීම් | 94 | 116 | 139 | 146 | 161 | 5,143 | 6,571 | 8,573 | 9,815 | 11,375 |
| ගෙවීම් | 54 | 71 | 79 | 86 | 118 | 2,953 | 4,026 | 4,862 | 5,831 | 8,380 |
| 3. ආයෝජන ආදායම් | -123 | -130 | -127 | -88 | -113 | -6,685 | -7,367 | -7,821 | -5,979 | -8,028 |
| ලැබීම් | 68 | 40 | 48 | 79 | 100 | 3,728 | 2,259 | 2,997 | 5,366 | 7,111 |
| ගෙවීම් | 191 | 170 | 175 | 168 | 213 | 10,413 | 9,626 | 10,818 | 11,345 | 15,139 |
| 3.1 ලාභ සහ ලාභාංශ | -19 | -13 | -22 | -19 | -51 | -1,006 | -718 | -1,391 | -1,316 | -3,666 |
| ලැබීම් | - | 2 | 1 | 4 | 1 | 11 | 89 | 84 | 279 | 33 |
| ගෙවීම් | 19 | 14 | 24 | 24 | 51 | 1,017 | 807 | 1,476 | 1,595 | 3,699 |
| 3.2 පොළී | -104 | -117 | -104 | -69 | -62 | -5,679 | -6,649 | -6,430 | -4,662 | -4,362 |
| ලැබීම් | 68 | 38 | 47 | 75 | 99 | 3,717 | 2,170 | 2,913 | 5,087 | 7,078 |
| ගෙවීම් | 172 | 156 | 151 | 144 | 161 | 9,396 | 8,820 | 9,342 | 9,750 | 11,440 |
| 4. රජයේ සේවා | -3 | -3 | -3 | -11 | -9 | -195 | -170 | -176 | -714 | -657 |
| ලැබීම් | 11 | 17 | 14 | 11 | 17 | 586 | 953 | 825 | 736 | 1,225 |
| ගෙවීම් | 14 | 20 | 16 | 22 | 27 | 781 | 1,123 | 1,001 | 1,450 | 1,881 |
| 5. වෙනත් සේවා | 5 | -5 | 15 | - 6 | -5 | 263 | -369 | 891 | -415 | -316 |
| ලැබීම් | 93 | 117 | 132 | 127 | 142 | 5,092 | 6,616 | 8,165 | 8,623 | 10,025 |
| ගෙවීම් | 88 | 122 | 117 | 134 | 146 | 4,829 | 6,985 | 7,273 | 9,038 | 10,342 |
| 6. මුළු සේවා | -72 | -65 | -23 | 28 | 12 | -3,905 | -3,773 | -1,430 | 1,821 | 820 |
| ලැබීම් | 391 | 440 | 489 | 535 | 627 | 21,365 | 24,897 | 30,256 | 36,050 | 44,363 |
| ගෙවීම් | 463 | 505 | 513 | 507 | 615 | 25,269 | 28,670 | 31,686 | 34,229 | 43,543 |
| 7. පෞද්ගලික සංක්‍රාම | 268 | 293 | 328 | 402 | 438 | 14,518 | 16,623 | 20,253 | 27,090 | 30,989 |
| ලැබීම් | 296 | 323 | 389 | 454 | 499 | 16,054 | 18,311 | 24,037 | 30,592 | 35,345 |
| ගෙවීම් | 28 | 30 | 61 | 52 | 61 | 1,536 | 1,688 | 3,784 | 3,501 | 4,357 |
| 8. නිල සංක්‍රාම | 130 | 148 | 130 | 115 | 115 | 7,142 | 8,407 | 8,027 | 7,749 | 8,069 |
| ලැබීම් | 130 | 148 | 130 | 115 | 115 | 7,142 | 8,407 | 8,027 | 7,749 | 8,069 |
| ගෙවීම් | - | - | - | - | - | - | - | - | - | - |
| 9. මුළු සංක්‍රාම | 398 | 441 | 457 | 517 | 552 | 21,660 | 25,030 | 28,290 | 34,839 | 39,057 |
| ලැබීම් | 426 | 471 | 519 | 569 | 614 | 23,196 | 26,718 | 32,064 | 38,341 | 43,414 |
| ගෙවීම් | 28 | 30 | 61 | 52 | 61 | 1,536 | 1,688 | 3,784 | 3,501 | 4,357 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන : 1993 දී දත්ත එකතුකිරීමේ ක්‍රමය වෙනස්කිරීම හේතුවෙන්, සේවා ගිණුමේ විශේෂයෙන්ම 1.4 හා 5, 1993 වර්ෂයෙන් පසු වර්ෂවලට අදාල දත්ත, සෘජුවම පෙර වර්ෂ හා ගැලපිය නොහැක.

විගැහි දශලක්ෂ 1,194 සිට 1994 විගැහි දශලක්ෂ 1,373 දක්වා සැළකියුතු ලෙස වැඩිවීමයි. පොළී ගෙවීම් විගැහි දශලක්ෂ 161 දක්වා විගැහි දශලක්ෂ 17 කින් වැඩි වූ අතර, ලාභ හා ලාභාංශ වශයෙන් වූ විදේශ විනිමය ගලායාම් විගැහි දශලක්ෂ 51 දක්වා විගැහි දශලක්ෂ 28 කින් වැඩිවිය. ඉහළ ආයෝජන ප්‍රතිලාභ අනුපාතිකය නිසා ලාභ හා ලාභාංශ වලින් විශාල ප්‍රමාණයක් රට තුළම රඳවා ගැනීමේ නැඹුරුවක් පිළිබිඹු වූ පසුගිය වසරට වඩා ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් මෙයින් පෙන්නුම් කෙරිණි.

## සංක්‍රාම ගිණුම

සංක්‍රාම ගිණුමේ ශුද්ධ ලැබීම්, විශේෂයෙන්ම පෞද්ගලික සංක්‍රාම තවදුරටත් රටෙහි ප්‍රධාන විදේශ විනිමය මාර්ගයක් වශයෙන් පැවතුණි. භාණ්ඩ, සේවා හා සංක්‍රාමවල මුළු ඉපැයීම්වලින් සියයට 14 ක් පමණ වන පෞද්ගලික සංක්‍රාම 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ454 (රුපියල් දශලක්ෂ 30,592) සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 499 (රුපියල් දශලක්ෂ 35,345) දක්වා වැඩි වූ අතර මෙය විශේෂයෙන්ම මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විසින් එවන ලද සංක්‍රාම ද ඇතුලත් පෞද්ගලික සංක්‍රාමවල වැඩිවීම නිසා සිදුවිය. කෙසේ වුවද, පෞද්ගලික සංක්‍රාම ගලාඒම් වැඩිවීමේ අනුපාතිකය 1993 වර්ෂයේදී සියයට 17 සිට 1994 වර්ෂයේදී සියයට10 දක්වා අඩු විය. මෙම අඩවීම, බොහෝදුරට 1994 වර්ෂයේදී දේශීය පොළී අනුපාතිකය අඩුවීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොල පොළී අනුපාත වැඩිවීම නිසා පොළී අනුපාතිකයන්හි වෙනස්වීම්වලට සංවේදීතාවයක් දක්වන සංක්‍රාමයන්හි මධ්‍යස්ථවීම නිසා සිදුවූවා වියහැක. මේ අතර, ශ්‍රී ලාංකික විගමනිකයින්ගේ වත්කම් පැවරීම සම්බන්ධව තිබූ සීමාවන් 1993 දී ලිහිල් කිරීමේ පූර්ණ ප්‍රතිඵල 1994 වර්ෂයේදී දක්නට ලැබුණ බැවින් පෞද්ගලික සංක්‍රාමවල ගලායැම් 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 52 ( රුපියල් දශලක්ෂ 3,501) සිට 1994 වර්ෂය තුළදී විගැහි දශලක්ෂ 61 (රුපියල් දශලක්ෂ 4,357) දක්වා වර්ධනය විය. නිලසංක්‍රාම 1993 වර්ෂයේදී පැවති විගැහි දශලක්ෂ 115 මට්ටමේම පැවතුණි. පෞද්ගලික හා නිල සංක්‍රාම යන දෙකෙහිම වෙනස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස සංක්‍රාම ගිණුමේ ශුද්ධ ගලාඒම් 1993 දී විගැහි දශලක්ෂ 517 (රුපියල් දශලක්ෂ 34,839) සිට 1994 දී විගැහි දශලක්ෂ 552 (රුපියල් දශලක්ෂ 39,057) දක්වා වැඩි විය.

## ජංගම ගිණුම

වෙළෙඳ ගිණුමේ ඇති වූ තියුණු පිරිහීමේ බලපෑම මත ජංගම ගිණුමේ හිඟය 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 281 (රුපියල් දශලක්ෂ 18,825) සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 531 ( රුපියල් දශලක්ෂ 37,767) දක්වා පුළුල් විය. ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස, හිඟය, 1993 වර්ෂයේදී සියයට 3.8 සිට 1994 වර්ෂයේදී සියයට 6.5 දක්වා වැඩිවිය. නිල සංක්‍රාම රහිතව ගත් කළ මෙම අනුපාතිකය 1993 වර්ෂයේදී සියයට 5.3 සිට 1994 වර්ෂයේදී සියයට 7.9 දක්වා වැඩි විය. ජංගම ගිණුමෙහි වසර දෙකක් තුළ අඛණ්ඩව පැවති යහපත් තත්ත්වයකින් පසුව ඇති වූ මෙම තියුණු පිරිහීම 1994 වර්ෂයේදී ගෙවුම් තුලනයෙහි අසතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කළ අතර එය මූලික වශයෙන් අර්ථිකයේ විශාල ආයෝජන හා ඉතුරුම් පරතරය තුලින් පිළිබිඹු වූ ඉල්ලුමෙහි දැඩි පීඩනය නිසා සිදුවිය. කෙසේ වුවද, මුළු ආනයනවල ආයෝජන භාණ්ඩ කොටස ප්‍රතිශතක අංක 2.5 කින් වැඩි වීම සහ පාරිභෝජන භාණ්ඩ කොටස ප්‍රතිශතක අංක 0.2 කින් පමණක් වැඩිවීම නිසා ඉල්ලුමෙහි ඇති වූ පීඩනය ඉතුරුම්වල අඩුවීමකට වඩා ආයෝජවල වැඩිවීම තුලින් පිළිබිඹු විය.

## ප්‍රාග්ධන ගිණුම

1993 වර්ෂයේදී ප්‍රාග්ධන ගලාඒම්වල ඇති වූ විශාල වැඩිවීමට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පෙන්නුම් කරමින් දේශීය වශයෙන් පැවති අවිනිශ්චිත දේශපාලන හා ආර්ථික වාතාවරණයට ආයෝජකයින්ගේ ප්‍රතිචාරය බොහෝදුරට පිළිබිඹු කරමින් 1994 දි ප්‍රාග්ධන ගිණුමේ ගලාඒම්වල සැළකියුතු මධ්‍යස්ථවීමක් විය. 1993 දි සියයට 61 ක වැඩිවීමක් වාර්තා කළ මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1994 දි විගැහි දශලක්ෂ 674 දක්වා සියයට 10 ක වැඩිවීමක් පමණක් පෙන්විය. සෘජු විදේශීය ආයෝජන හා කොටස් වෙළෙඳපොළ ආයෝජන ස්වරූපයෙන් පෞද්ගලික අංශයට ලැබුණු ප්‍රාග්ධන ගලාඒම්වල හා රාජ්‍ය අංශය වෙත මුද හරින ලද ණයවල සැළකිය යුතු අඩුවීමක් විය.

ආයෝජන මණ්ඩලය යටතේ වාණිජමය වශයෙන් ක්‍රියාත්මකව පැවති නව ව්‍යවසායයන් 1993 වර්ෂයේදී ඒකක 94 සිට 1994 වර්ෂයේදී ඒකක 137 දක්වා වැඩි වුවද, 1993 දී විගැහි දශලක්ෂ 134 ක් වූ සෘජු විදේශීය ආයෝජන 1994 විගැහි දශලක්ෂ 111 දක්වා අඩු වූ බව තාවකාලික ඇස්තමේන්තු වලට අනුව පෙන්නුම් කෙරිණි. කොටස් වෙළෙඳපොළ ආයෝජන සඳහා වූ විදේශීය ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් ද 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 48 සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 20 දක්වා අඩු විය. 1994 වර්ෂයේ මාර්තු, අප්‍රේල් මාසවල හා අවසාන කාර්තුවේදී කොළඹ කොටස් වෙළෙඳපොළෙහි අනේවාසිකයින් විසින් විකුණන ලද කොටස් ප්‍රමාණය ඔවුන් විසින් මිළදී ගත් කොටස් ප්‍රමාණයට වඩා වැඩි විය. කොටස් වෙළෙඳපොළ ආයෝජනයන්හි ඇති වූ මෙම සැළකිය යුතු අඩුවීමට හේතු වූයේ ජාතික මැතිවරණ මධ්‍යයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම් කැපී පෙනෙන ලෙස ලිහිල්වීම නිසා ආයෝජකයින් සුපරීක්ෂාකාරී ආකල්පයක් දැරීමත්, සංවර්ධිත රටවල ආයෝජන සඳහා පැවති වාතාවරණය වඩා යහපත් වීමත්ය.


වැඩි ප්‍රමාණයක් සහනදායී මූල්‍ය ආධාර වලින් සමන්විත රජයේ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් ද 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 190 (රුපියල් දශලක්ෂ 12,579) සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 146 (රුපියල් දශලක්ෂ 10,348) දක්වා සියයට 23 ක අඩුවීමක් වාර්තා කළේය. මෙම අඩුවීමට විශාල ලෙස බලපානු ලැබුවේ සහනදායී නොවන ණය අඩුවෙන් ලබා ගැනීමය. රජයට ලැබුණු මුළු විදේශීය ප්‍රාග්ධන ගලාඒම් 1993 දී විගැහි දශලක්ෂ 334 සිට 1994 දි විගැහි දශලක්ෂ 283 දක්වා අඩු වුවත්, ව්‍යාපෘති ණය මුදහැරීම් විගැහි දශලක්ෂ 192 සිට විගැහි දශලක්ෂ 259 දක්වා වැඩිවිය. ජපානය, රජයට මූල්‍ය ආධාර සපයන ප්‍රධාන මූලය බවට පත්විය. ජපන් ණය උපයෝජනය 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 66 සිට 1994 වර්ෂයේදි විගැහි දශලක්ෂ 126 දක්වා වැඩි වූ අතර, ආසියානු සංවර්ධන බැංකුවෙන් හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනයෙන් ගත් ණය උපයෝජනය කිරීම වසර දෙක තුළදී පිළිවෙලින් විගැහි දශලක්ෂ 88 හා විගැහි දශලක්ෂ 87 සිට විගැහි දශලක්ෂ 64 හා විගැහි දශලක්ෂ 54 දක්වා අඩු විය.

මෙම තත්ත්වයන්ට ප්‍රතිවිරුද්ධව දිගු හා කෙටිකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලාඒම් තවදුරටත් සැළකිය යුතු ලෙස වැඩි විය. 1994 දී පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධන ගලාඒම් විගැහි දශලක්ෂ 281 දක්වා විගැහි දශලක්ෂ 64 කින් වැඩි විය. එයාර් ලංකා අහස්යානා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ අහස්යානා මිළදී ගැනීම සඳහා වූ විදේශීය මූල්‍යනය කිරීම්, රාජ්‍ය අනුග්‍රහය යටතේ බස් ගෙන්වීම සඳහා ලබාගත් ණය සහ ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති සඳහා ණය ප්‍රාග්ධන වශයෙන් වූ ප්‍රධාන විදේශ විනිමය ගලාඒම් මෙහි අඩංගු විය. 1994 වර්ෂයේදී අහස්යානා මිළදී ගැනීම වෙනුවෙන් අත්තිකාරම් ගෙවීම් නොතිබුණු නිසා, පෞද්ගලික ප්‍රාග්ධන ගලායාම් 1993 දී විගැහි දශලක්ෂ 83 සිට 1994 දී විගැහි දශලක්ෂ 65 දක්වා අඩු විය. පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන ගලායාම් 1993 දී ප්‍රධාන වශයෙන්ම, එයාර් ලංකා ආයතනය ලබා ගත් ණය, බස් මිළදී ගැනීමේ ව්‍යාපෘතියට ලබාගත් ණය සහ ආයෝජන මණ්ඩලය යටතේ පැවති ව්‍යසායයන් විසින් ලබාගත් ණය ආපසු ගෙවීම් වලින් සමන්විත විය.

පෞද්ගලික කෙටිකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1993 දී විගැහි දශලක්ෂ 105 සිට 1994 දී විගැහි දශලක්ෂ 182 දක්වා සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. 1993 වර්ෂයේදී මෙය සාපේක්ෂ වශයෙන් අඩු අගයක් වාර්තා කිරීමට බොහෝ දුරට හේතු වූයේ ආයෝජන මණ්ඩලය යටතට අයත් නොවන ආයතන සඳහා විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ලබාදුන් ණය 1993 වර්ෂයේදී දේශීය බැංකු ඒකකවලට මාරු කිරීමයි. මෙම ණය මාරු කිරීම නිසා 1993 දී විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවලට ණය ආපසු ගෙවීම් සිදුවූ බැවින් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් දේශීය ව්‍යවසායයන්ට දෙනු ලැබූ ශුද්ධ ණය ප්‍රමාණයෙහි අඩුවීමක් පෙන්නුම් කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික කෙටිකාලීන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් සාපේක්ෂව අඩු අගයන් වාර්තා කෙරිණි. 1994 වර්ෂයේ කෙටිකාලීන ප්‍රාග්ධන ගලාඒම්, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්ට අමුද්‍රව්‍ය ආනයනයන් මූල්‍යනය කිරීම සඳහා දුන් ණය ද ඇතුලත්ව වෙළෙඳ ණය සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාදුන් ණය වලින් සමන්විත විය.

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1.54 සංඛ්‍යා සටහන

**1990 - 1994 ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්**

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992 | 1993 | 1994 | 1990 | 1991 | 1992 | 1993 | 1994 |
| 1. රජය (අ) | 19.3 | 26.7 | 23.4 | 23.4 | 15.6 | 1,104.5 | 1,631.6 | 1,482.1 | 1,597.2 | 1,132.3 |
| 2. රාජ්‍ය නියෝජකත්ව | - | - | - | - | - | 1.1 | 1.1 | 1.0 | 1.1 | - |
| 3. මහ බැංකුව | 286.3 | 475.9 | 657.9 | 1,193.7 | 1,373.3 | 16,399.2 | 28,956.9 | 41,591.7 | 81,403.6 | 99.858.5 |
| 4. වෙළෙඳ බැංකු | 296.4 | 306.2 | 365.7 | 326.4 | 403.3 | 16,966.8 | 18,633.4 | 23,160.7 | 22,256.2 | 29,349.3 |
| 5. එකතුව | 602.0 | 808.8 | 1,047.0 | 1,543.5 | 1,792.2 | 34,471.6 | 49,223.0 | 66,235.5 | 105,258.1 | 130,340.1 |
| 6. දළ විදේශීය සම්පත් මගින් කළ හැකි ආනයන - මාස ගණන | | | | | | | | | | |
| 6.1 වෙළෙඳ භාණ්ඩ | 3.7 | 4.4 | 5.1 | 6.5 | 6.5 | | | | | |
| 6.2 භාණ්ඩ හා සේවා | 3.0 | 3.6 | 4.2 | 5.5 | 5.5 | | | | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඒකහවන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කර ඇත.

| වර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 |
|---|---|---|---|---|---|
| විගැහි 1 කට රුපියල් | 57.25 | 60.85 | 63.33 | 68.19 | 72.76 |

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුළත් කිරීම සඳහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

## විදේශීය වත්කම්

මධ්‍යස්ථ වර්ධනයක් පෙන්වූ විදේශීය ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින පුළුල් කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබුණු විගැහි දශලක්ෂ 56 ක ශුද්ධ ලැබීමක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් 1993 වර්ෂාවසානයේදී විගැහි දශලක්ෂ1,544 (රුපියල් දශලක්ෂ 105,258) සිට 1994 වර්ෂාවසානයේදී විගැහි දශලක්ෂ 1,792 ( රුපියල් දශලක්ෂ 130,340) දක්වා සියයට 16 ක වැඩිවීමක් වාර්තා කළේය. විදේශීය වත්කම්වල සමස්ත වැඩිවීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ හා වාණිජ බැංකුවල විදේශීය වත්කම් විගැහි දශලක්ෂ 1,373 දක්වා සියයට 15 කින් හා විගැහි දශලක්ෂ 403 දක්වා සියයට 24 කින් වර්ධනයවීම සහ රජය සතු විදේශීය වත්කම් විගැහි දශලක්ෂ 16 දක්වා විගැහි දශලක්ෂ 8 කින් අඩුවීම තුළින් පිළිබිඹු විය. ශ්‍රී ලංකා මහ බැංකුව හා රජය සතු විදේශිය වත්කම් වලින් සමන්විත දළ නිල සංචිත වර්ෂ දෙක අතර විගැහි දශලක්ෂ 1,389 දක්වා විගැහි දශලක්ෂ 172 කින් වැඩි විය. 1994 වර්ෂාවසානයේදි පැවති දළ විදේශීය වත්කම් 1995 සඳහා තක්සේරු කරන ලද මාස 5.9 ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ අතර, දළ නිල සංචිත ප්‍රමාණය මාස 4.6 ආනයන මූල්‍යනය සඳහා ප්‍රමාණවත් විය.

## විනිමය අනුපාතික සංචලනයන්

ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය අගය, 1994 වර්ෂය පුරාම ජපන් යෙන් වලට සාපේක්ෂව අවප්‍රමාණයක් පෙන්නුම් කළ අතර අනිකුත් ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ගවලට ප්‍රතිමුඛව උච්චාවචනය විය. ජාත්‍යන්තර විදේශීය විනිමය හා මූල්‍ය වෙළෙඳපොළෙහි පැවති අස්ථාවර තත්ත්වයන් නිසා ප්‍රධාන විදේශීය ව්‍යවහාර මුදල් අතර විනිමය අනුපාතයන්හි උච්චාවචනයවීම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ විනිමය වෙළෙඳපොළෙහි පැවති තත්ත්වයන්ද රුපියලේ සංචලනයන් තුලින් පිළිබිඹු විය. 1993 වර්ෂය අග පැවති විනිමය අනුපාත හා සසඳන විට 1994 වර්ෂය අගදී ජපන් යෙන්, ජර්මන් මාර්ක්, ප්‍රංශ ප්‍රැනක් සහ බ්‍රිතාන්‍ය පවුම්වලට ප්‍රතිමුඛව එ. ජ. ඩොලරය තියුණු ලෙස අවප්‍රමාණය වූ අතර දේශීය වෙළෙඳපොළහි ශුද්ධ විදේශිය වත්කම් වැඩිවීමක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශීය විනිමය වෙළෙඳපොළෙහි මැදිහත්වීම සඳහා භාවිතා කරන එ. ජ. ඩොලරයට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියල 1993 වර්ෂාවසානයේ පැවති විනිමය අනුපාතය හා සසඳන විට 1994 වර්ෂාවසානයේදී සියයට 0.8 කින් ආන්තික වශයෙන් අවප්‍රමාණය විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා රුපියල, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි සාපේක්ෂ වශයෙන් ශක්තිමත් මුදල් වර්ග වන ජපන් යෙන්, ජර්මන් මාර්ක්, ප්‍රංශ ප්‍රැනක් හා බ්‍රිතාන්‍ය පවුම්වලට ප්‍රතිමුඛව පිළිවෙලින් සියයට 11.4, 10.7, 9.1 සහ 5.8 කින් වැනි ඉහළ අනුපාතයන්ගෙන් අවප්‍රමාණය විය. එය ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛවද සියයට 1 කින් අවප්‍රමාණය විය. ප්‍රධාන මුදල් වර්ගවලට ප්‍රතිමුඛව ඇති වූ වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා රුපියල විගැහිවලට ප්‍රතිමුඛව 1993 දී සියයට 7.1 ක අවප්‍රමාණය හා සැසඳීමේදී, 1994 දි සියයට 6.3 කින් අවප්‍රමාණය විය.

මෙම විනිමය අනුපාතික සංචලනයන්ගේ ඒකාබද්ධ ප්‍රතිඵලය පෙන්නුම් කරමින්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන්ට සාපේක්ෂව වෙළෙඳාම මත බර තබන ලද නාමික විනිමය අනුපාතය ලෙස නිර්වචනය කරන ලද ශ්‍රී ලංකාවේ නාමික සඵල විනිමය අනුපාතිකය ලක්ෂිත පදනම අනුව බලන විට, 1993 දෙසැම්බර් සිට 1994 දෙසැම්බර් දක්වා සියයට 5.1 කින් අවප්‍රමාණය විය. ශ්‍රී ලංකාව හා එහි ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් අතර උද්ධමන අනුපාත අතර වෙනස්කම් සඳහා නාමික විනිමය අනුපාත ගැලපීමෙන් ලබා ගන්නා මූර්ත සඵල විනිමය අනුපාතිකය ලක්ෂිත පදනමක් මත සියයට 3.2 කින් අවප්‍රමාණය විය. 1994 රුපියලෙහි නාමික සඵල විනිමය අනුපාතිකයෙහි වාර්ෂික සාමාන්‍යය සියයට 4.6 කින් අවප්‍රමාණය වූ අතර, මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි සාමාන්‍යය සියයට 3.2 කින් ප්‍රතිප්‍රමාණය විය.


## විදේශීය ණය

1993 වර්ෂාවසානයේ සිට 1994 වර්ෂාවසානය දක්වා විගැහි දශලක්ෂ 504 ක වැඩිවීමක් වාර්තා කරමින්, 1994 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකාවේ විදේශීය ණය ප්‍රමාණය විගැහි දශලක්ෂ 6,089 ක් ලෙස තක්සේරු කර ඇත. මෙම වැඩිවීම තුලින් බෙහෙවින්ම පිළිබිඹු වූයේ මෙම

# සඵල විනිමය අනුපාතික *

ත්‍රෛමාසික සාමාන්‍ය

1985 = 100




* දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව.

1.55 සංඛ්‍යා සටහන

## 1990 - 1994 විනිමය අනුපාතික වෙනස්වීම්

| මුදල් වර්ගය | වර්ෂය අගදී පැවති අනුපාතික (ඒකකයකට රුපියල්) | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම් (අ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) |
| ඩොයිෂ් මාර්ක් | 26.1554 | 28.0178 | 28.5714 | 28.7371 | 32.1622 | -9.39 | -6.65 | -1.94 | -0.58 | -10.65 |
| ප්‍රංශ ප්‍රැන්ක් | 7.7125 | 8.1924 | 8.3857 | 8.4655 | 9.3151 | -10.08 | -5.86 | -2.31 | -0.94 | -9.12 |
| ඉන්දියානු රුපියල් | 2.2332 | 1.6352 | 1.7520 | 1.5774 | 1.5926 | 5.69 | 36.57 | -6.67 | 11.07 | -0.95 |
| ජපන් යෙන් | 0.2943 | 0.3390 | 0.3699 | 0.4433 | 0.5004 | -4.32 | -13.19 | -8.35 | -16.56 | -11.41 |
| ස්ටර්ලින් පවුම් | 75.5908 | 79.5820 | 69.4278 | 73.4972 | 78.0513 | -13.96 | -5.02 | 14.63 | -5.54 | -5.83 |
| ඇ.එ.ජ. ඩොලර් | 40.2400 | 42.5800 | 46.0000 | 49.5615 | 49.9800 | -0.60 | -5.50 | -7.43 | -7.19 | -0.84 |
| විශේෂ ගැනුම් හිමිකම් | 57.2479 | 60.8464 | 63.3337 | 68.1932 | 72.7604 | -7.54 | -5.91 | -3.93 | -7.13 | -6.28 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාල විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම් පදනම් කරගෙනය.

සටහන : සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

1.56 සංඛ්‍යා සටහන

## 1990 - 1994 නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) |
| 1. මැදි හා දිගු කාලීන ණය | 3,822.4 | 4,246.0 | 4,624.3 | 5,059.8 | 5,381.8 | 216,846.3 | 255,798.0 | 289,678.6 | 345,083.2 | 390,285.1 |
| 1.1 රජයේ (අ) | 3,184.4 | 3,589.0 | 3,840.8 | 4,122.7 | 4,192.0 | 182,300.3 | 218,400.0 | 243,250.6 | 281,142.3 | 305,010.8 |
| 1.2 රජයේ ඇප සහිත රාජ්‍ය සංසථා | 136.0 | 141.0 | 175.6 | 246.4 | 398.3 | 7,781.0 | 8,578.0 | 11,120.7 | 16,804.0 | 28,977.0 |
| 1.3 රජයේ ඇප සහිත පෞද්ගලික අංශයේ | 108.0 | 120.0 | 129.0 | 144.0 | 156.5 | 6,185.0 | 7,319.0 | 8,172.8 | 9,821.4 | 11,384.0 |
| 1.4 රජයේ ඇප රහිත රාජ්‍ය සංස්ථා | 5.0 | 3.0 | 2.4 | 1.4 | 0.4 | 290.0 | 197.0 | 151.0 | 96.6 | 29.5 |
| 1.5 රජයේ ඇප රහිත පෞද්ගලික අංශයේ | 101.0 | 113.0 | 138.7 | 169.6 | 211.9 | 5,802.0 | 6,867.0 | 8,784.4 | 11,565.6 | 15,416.8 |
| 1.6 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැණුම් | 288.0 | 280.0 | 337.8 | 375.7 | 422.8 | 14,488.0 | 14,437.0 | 18,199.1 | 25,653.3 | 29,467.0 |
| 2. කෙටි කාලීන ණය | 294.0 | 350.0 | 420.6 | 525.7 | 707.4 | 16,820.0 | 20,200.0 | 24,578.6 | 31,689.0 | 44,621.5 |
| 2.1 රජය | - | 21.0 | - | - | - | - | 1,275 | - | - | - |
| 2.2 මහ බැංකුවේ ණය ගැනීම් | - | - | - | - | - | - | - | - | - | - |
| 2.3 අනෙකුත් (ඇ) (අ) | 294.0 | 329.0 | 420.6 | 525.7 | 707.4 | 16,820.0 | 18,925.0 | 24,578.6 | 31,689.0 | 44,621.5 |
| 3. මුළු ණය (1+2) | 4,116.4 | 4,596.0 | 5,044.9 | 5,585.5 | 6,089.2 | 233,666.3 | 275,998.0 | 314,257.2 | 376,772.2 | 434,906.6 |
| විශේෂිත අයිතමයන් | | | | | | | | | | |
| මැදි හා දිගුකාළීන ණය | | | | | | | | | | |
| 1. යෝජනාක්‍රම ණය | 2,179.0 | 2,393.0 | 2,555.9 | 2,710.8 | 2,[illegible]91.0 | 124,775.0 | 145,631.0 | 161,873.4 | 184,859.1 | 210,353.7 |
| 2. යෝජනාක්‍රම නොවන ණය | 1,010.0 | 1,177.0 | 1,251.1 | 1,304.9 | 1,239.0 | 57,832.0 | 71,600.0 | 79,233.7 | 88,984.0 | 90,146.7 |
| 3. සැපයුම් කරුවන්ගේ ණය | 33.0 | 30.0 | 61.2 | 118.6 | 110.6 | 1,892.0 | 1,805.0 | 3,873.4 | 8,087.1 | 8,050.5 |
| 4. ජා.මු.අ. භාරකාරත්ව අරමුදලේ ණය | 0.4 | - | - | - | - | 19.3 | - | - | - | - |
| 5. ජා. මු.අ. අනෙකුත් ණය | 288.0 | 280.0 | 337.8 | 375.7 | 422.8 | 14,488.0 | 14,437.0 | 18,199.1 | 25,653.3 | 29,467.0 |
| 6. අනෙකුත් (ඈ) | 312.0 | 366.0 | 418.3 | 549.8 | 718.4 | 17,840.0 | 22,325.0 | 26,499.0 | 37,499.7 | 52,267.2 |

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික.

(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය, වෙළෙඳ ණය සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබාගත් කෙටිකාලීන ණය ඇතුළත්වේ.

(ඈ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.57 සංඛ්‍යා සටහන

## 1990 - 1994 ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | විගැහි දශ ලක්ෂ | | | | | රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) | 1990 | 1991 | 1992 | 1993(අ) | 1994(ආ) |
| 1. ණය සේවා ගෙවීම් | 328.6 | 356.3 | 382.3 | 357.5 | 372.4 | 17,972.0 | 20,173.0 | 23,671.0 | 24,066.4 | 26,332.6 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 182.0 | 200.5 | 231.0 | 213.2 | 211.0 | 9,975.0 | 11,353.0 | 14,328.8 | 14,316.8 | 14,892.4 |
| (i) ජා. මු. අරමුදලට | 31.8 | 63.6 | 54.4 | 18.1 | 8.9 | 1,731.0 | 3,600.0 | 3,359.4 | 1,118.8 | 615.7 |
| (ii) අනෙකුත් | 150.2 | 136.9 | 176.6 | 195.1 | 202.1 | 8,244.0 | 7,753.0 | 10,969.4 | 13,198.0 | 14,276.7 |
| 1.2 පොළී ගෙවීම් | 146.6 | 155.8 | 151.3 | 144.3 | 161.4 | 7,997.0 | 8,820.0 | 9,342.2 | 9,749.6 | 11,440.2 |
| (i) ජා. මු. අරමුදලට | 20.6 | 14.7 | 7.8 | 5.4 | 4.9 | 1,121.0 | 830.0 | 480.5 | 362.8 | 348.3 |
| (ii) අනෙකුත් | 126.0 | 141.1 | 143.5 | 138.9 | 156.5 | 6,876.0 | 7,990.0 | 8,861.7 | 9,386.8 | 11,091.9 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපැයීම් | 1,847.0 | 1,930.7 | 2,233.7 | 2581.3 | 2,862.4 | 100,845.5 | 109,275.0 | 138,111.0 | 174,223.9 | 202,916.5 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම ඉපැයීම් | 2,143.0 | 2,253.7 | 2,622.6 | 3,034.9 | 3,361.3 | 116,899.5 | 127,586.0 | 162,147.7 | 204,815.4 | 238,261.6 |
| 4. ණය සේවා අනුපාතික (ඇ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 17.8 | 18.5 | 17.1 | 13.8 | 13.0 | 17.8 | 18.5 | 17.1 | 13.8 | 13.0 |
| (ii) ජා. මු. අරමුදලේ ගණුදෙනු හැර | 15.0 | 14.4 | 14.3 | 12.9 | 12.5 | 15.0 | 14.4 | 14.4 | 12.9 | 12.5 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 15.3 | 15.8 | 14.6 | 11.8 | 11.1 | 15.4 | 15.8 | 14.6 | 11.8 | 11.1 |
| (ii) ජා. මු. අරමුදලේ ගණුදෙනු හැර | 12.9 | 12.3 | 12.2 | 11.0 | 10.7 | 12.9 | 12.3 | 12.2 | 11.0 | 10.6 |
| 5. 1 හි ඇතුළත් රජයේ ණය සේවා ගෙවීම් කොටස (ඇ) | 168.0 | 178.0 | 205.9 | 221.6 | 220.9 | 9,141.0 | 10,075.0 | 12,713.0 | 14,933.5 | 15,625.9 |
| 5.1 එය 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 51.1 | 49.9 | 51.1 | 62.0 | 59.3 | 50.9 | 49.9 | 51.0 | 62.4 | 59.3 |

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික.

(ඇ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදු වූ වෙනස්වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

(ඈ) ජා. මු. අරමුදලෙහි ගණුදෙනු හැර.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහනෙහි ප්‍රාග්ධන ගිණුම යටතේ සාකච්ඡා කරන ලද පෞද්ගලික අංශය ලබාගත් ණයවල වැඩිවීමයි. 1994 වර්ෂාවසානයේදී නොගෙවා ඉතිරිව ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 69 ක් පමණ වූ රජයේ මැදි හා දිගුකාලීන ණය, විගැහි දශලක්ෂ 69 ක වැඩිවීමක් වාර්තා කළ අතර මෙය විශේෂයෙන්ම ජපානය, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය මගින් ප්‍රදානය කරන ලද සහනාදයී ආධාරවලින් සමන්විත විය. එමෙන්ම පුළුල් කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම්වල තෙවන වසර වැඩපිළිවෙලෙහි ප්‍රථම අදියර යටතේ ශ්‍රී ලංකාවට විගැහි දශලක්ෂ 56 ක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ද ලැබුණි. ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ කලින් ලබාගත් ණය සඳහා කළ විගැහි දශලක්ෂ 9 ක ආපසු ගෙවීමක් සමඟ 1994 වර්ෂාවසානයේදී ජා. මු. අ. ට නොගෙවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය විගැහි දශලක්ෂ 423 දක්වා විගැහි දශලක්ෂ 47 කින් වැඩි විය.

## ණය සේවා ගෙවීම්

මැදි හා දිගුකාලීන ණය ආපසු ගෙවීම් හා සියළුම විදේශ ණය වෙනුවෙන් කරන ලද පොළී ගෙවීම් අඩංගු ණය සේවා ගෙවීම්, 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 372 දක්වා විගැහි දශලක්ෂ 15 කින් හෙවත් සියයට 4 කින් වැඩිවුණි. මෙය ණය ආපසු ගෙවීම්වල විගැහි දශලක්ෂ 2 ක ආන්තික අඩුවීම සහ පොළී ගෙවීම්වල විගැහි දශලක්ෂ 17 ක වැඩිවීම යන දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් පරිබාහිර වූ ණය ආපසු ගෙවීම් විගැහි දශලක්ෂ 7 කින් වැඩි වූ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කරන ලද එවැනි ගෙවීම් 1993 වර්ෂයේදී විගැහි දශලක්ෂ 18 සිට 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 9 දක්වා අඩු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් ණය සඳහා ගෙවන ලද පොළී ආන්තික වශයෙන් අඩුවූ අතර, ඉන් පරිබාහිරව ලබාගත් ණය සඳහා පොළී ගෙවීම් විගැහි දශලක්ෂ 18 කින් වැඩි විය. කෙසේ වුවද, වර්ෂය තුල භාණ්ඩ හා සේවා අපනයන වලින් ලත් ඉපැයීම් ණය සේවා ගෙවීම්වලට වඩා වැඩි වේගයකින් වර්ධනය වීමත් සමඟ වසර දෙක තුළදී ණය සේවා අනුපාතිකය සියයට 13.8 සිට සියයට 13.0 දක්වා අඩු වුණි. භාණ්ඩ හා සේවා අපනයන සහ පෞද්ගලික සංක්‍රාමවල ඉපැයීම් හි ප්‍රතිශතයක් වශයෙන් ණය සේවා අනුපාතිකය කාලපරිච්ඡේද දෙක තුළදී සියයට 11.8 සිට සියයට 11.1 දක්වා අඩු විය.